සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**මධ්‍ය වාර පරීක්ෂණය 2015**

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

**10 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01 ජීවත්වීම සඳහා මිනිසාට ශාරීරික හා මානසිකව ඉෂ්ඨ කර ගත යුත්තේ,

(1) වුවමනාය (2) අවශ්‍යතාය (3) මූලික අවශ්‍යතාය (4) මේ සියලු දේමය

02 එකම භාණ්ඩයක් හෝ සේවාවක් පාරිභෝගිකයාට සැපයීම සඳහා විවිධ වූ ව්‍යාපාරික ආයතන ඇතිවීමට බලපා ඇති ප්‍රධාන සාධකය වනුයේ,

(1) පාරිභෝගික අවශ්‍යතා විවිධ වීමයි.

(2) පාරිභෝගික වුවමනා විවිධ වීමයි.

(3) පාරිභෝගික අවශ්‍යතා නිර්මාණය කළ හැකි වීමයි.

(4) ව්‍යාපාර අතර තරගකාරීත්වය ඇතිවීමයි.

03 ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පැවතිය හැකි විවිධ අරමුණු අතර පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණකි

(1) භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහළ නැංවීම.(2) රැකියා උත්පාදනය

(3) ලාභ ඉපයීම (4) සේවක සුබ සාධනය

04 මිනිස් අවශ්‍යතා හා වුවමනා සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) අවශ්‍යතා තුළින් වුවමනා ගොඩනැගීමයි.

(2) අවශ්‍යතා පොදුවන අතර වුවමනා පෞද්ගලික වීමයි.

(3) වුවමනා තුළින් අවශ්‍යතා ගොඩනැගීමයි.

(4) වුවමනා අසීමිත වන අතර අවශ්‍යතා සීමිත වීමයි.

05 භාණ්ඩ හා සේවා සැසඳීමේ දී සේවාවක දැකිය හැකි ලක්ෂණයක් වනුයේ,

(1) ඒකාකාරී වීමයි. (2) ස්පර්ශ කළ හැකි වීමයි.

(3) වෙන්කළ හැකි වීමයි. (4) ගබඩා කළ නොහැකි වීමයි.

06 ව්‍යාපාරික ආයතනයකින් භාණ්ඩ හා සේවා මිලදී ගන්නා පුද්ගලයා හඳුන්වන්නේ,

(1) ගනුදෙනුකරුවෝ ලෙසය. (2) සැපයුම්කරුවෝ ලෙසය.

(3) තරගකරුවෝ ලෙසය. (4) මිලදී ගන්නන් ලෙසය

07 ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශව අතුරින් අයිතිකාර පාර්ශවය අපේක්ෂා කරන අරමුණු අතර නොගැලපෙන අරමුණ වන්නේ,

(1) ආයෝජනයේ සුරක්ෂිතතාව (2) ප්‍රමාණවත් ලාභයක් ලැබීම

(3) රැකියා තෘප්තිය ලැබීම (4) ව්‍යාපාරයේ අනාගත වර්ධනය

08 අභ්‍යන්තර පරිසර සාධක පමණක් ඇතුළත් වන්නේ,

(1) අයිතිකරු, කළමනාකරු, සැයපුම්කරු

(2) අයිතිකරු, කළමනාකරු, සේවකයෝ

(3) අයිතිකරු, කළමනාකරු, තරගකරුවෝ

(4) අයිතිකරු, කළමනාකරු, ගනුදෙනුකරුවෝ

09 ආර්ථික පරිසරයට අයත් සාධක පමණක් අයත් වන්නේ,

(1) උද්ධමනය, ආකල්ප, ඉතුරුම්, ජාත්‍යන්තර සබඳතා

(2) උද්ධමනය, පොලී අනුපාතය, නීතිරීති, රැකියා වියුක්තිය

(3) පොලී අනුපාතය, උද්ධමනය, ඉතුරුම්, විදේශ විනිමය අනුපාතය

(4) ආකල්ප, නීතිරීති, උද්ධමනය, ඉතුරුම්, පොලී අනුපාතය

10 ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි වන්නේ,

(1) ශක්තීන් හා දුර්වලතාය (2) අවස්ථා හා තර්ජනයන්ය

(3) ශක්තීන් හා තර්ජනයන්ය (4) අවස්ථා හා දුර්වලතාය

11 ලාභ අරමුණු කරගත් පොදු අංශයට අයත්වන ව්‍යාපාරයකි

(1) සමුපකාර සමිති (2) රාජ්‍ය සංස්ථා (3) සංස්ථා සමාගම් (4) රාජ්‍ය සමාගම්

12 පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අදාළ නොවන කරුණක් වන්නේ,

(1) අදාළ කර්මාන්තය තුළ බලපෑමක් කළ හැකි

(2) කුඩා පරිමාණ ප්‍රාග්ධනයක් ආයෝජනය කර ඇති

(3) අඩු සේවක සංඛ්‍යාවක් සිටින

(4) වෙළඳපල කොටස කුඩා වූ ව්‍යාපාරයි

13 ව්‍යාපාර සංවිධාන අතුරින් තීරණ ගැනීමේ දී වඩා ස්වාධීන ව්‍යාපාර සංවිධානය වනුයේ,

(1) සීමා සහිත සමාගම් (2) ඒක පුද්ගල ව්‍යාපාර

(3) හවුල් ව්‍යාපාර (4) සමුපකාර

14 නෛතික පුද්ගලභාවයක් සහිත ව්‍යාපාර සංවිධානයක් වනුයේ,

(1) සමුපකාර (2) හවුල් ව්‍යාපාර (3) සීමිත සමාගම් (4) කේවලස්වාමි ව්‍යාපාර

15 ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින ව්‍යාපාර සංවිධානය වනුයේ,

(1) හවුල් ව්‍යාපාර (2) සීමිත සමාගම් (3) සමිති සංවිධාන (4) සමුපකාර

16 අසීමිත වගකීමක් ඇති ව්‍යාපාර සංවිධානයකි

(1) රාජ්‍ය සංස්ථා (2) කේවලස්වාමි ව්‍යාපාර (3) දෙපාර්තමේන්තු (4) iumldr

17 හවුල් ව්‍යාපාරයක් පුළුල්වීම සීමා වී ඇත්තේ,

(1) හවුල්කරුවන්ගේ වගකීම සීමාසහිත වීම නිසා

(2) හවුල් ව්‍යාපාරයක් ගිවිසුමක් මත පවත්වා ගත යුතු නිසා

(3) හවුල්කරුවන්ගේ සංඛ්‍යාව 20 කට සීමාවී තිබීම නිසා

(4) හවුල් ව්‍යාපාර 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව පාලනය වන නිසා

18 ජංගම නොවන වත්කමක් වනුයේ

(1) බඩු තොගය (2) ලී බඩු උපකරණ (3) ණයගැතියෝ (4) බැංකු ශේෂය

19 වගකීමක් සම්බන්ධයෙන් අදාළ විය නොහැකි කරුණ වන්නේ,

(1) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම.

(2) අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒම.

(3) බේරුම්කිරීමේ දී ව්‍යාපාරයේ සම්පත් පිටතට ගලායෑම.

(4) වර්තමාන බැඳීමක් තිබීම.

20 නිවැරදි ගිණුම්කරණ සමීකරණය වනුයේ,

(1) ප්‍රාග්ධනය + වගකීම් = වත්කම් (2) ප්‍රාග්ධනය + වත්කම් = හිමිකම්

(3) වත්කම් = ප්‍රාග්ධනය - වගකීම් (4) හිමිකම් = වත්කම් + වියදම්

21 ව්‍යාපාරයක් සතුව පවත්නා ආර්ථික සම්පත් සමූහය

(1) වගකීමය (2) වත්කමය (3) හිමිකමය (4) ආදායමය

22 වත්කම් අත්පත් කර ගැනීම පිණිස ව්‍යාපාරයේ අයිතිකරුවන් යෙදූ ප්‍රාග්ධනයට අමතරව බාහිරින් යෙදවූ මුදල්

(1) වත්කමකි. (2) වියදමකි. (3) හිමිකමකි. (4) වගකීමකි.

23 අයිතිකරු රු. 100000/- අමතර ප්‍රාග්ධනය යෙදීම නිසා

(1) වත්කම් හා වගකීම් වැඩිවේ. (2) වගකීම් හා හිමිකම් අඩුවේ.

(3) වත්කම් හා හිමිකම් වැඩිවේ. (4) වත්කම් වැඩිවී වගකීම් අඩුවේ.

24 වැඩිවීම හර වශයෙන් ද, අඩුවීම බැර වශයෙන් ද සටහන් වන ගිණුම් වර්ග වනුයේ,

(1) වත්කම් හා වගකීම් ගිණුම් පමණි. (2) වත්කම් හා වියදම් ගිණුම් පමණි.

(3) වත්කම් හා ආදායම් ගිණුම් පමණි. (4) වත්කම් හා හිමිකම් ගිණුම් පමණි.

25 ලෙජරය යනුවෙන් අදහස් වනුයේ,

(1) ව්‍යාපාරයේ ගිණුම් සියල්ල ඇතුළත් පොතයි.

(2) ව්‍යාපාරයේ මුදල් සටහන් ඇතුළත් කරන පොතයි.

(3) ද්විත්ව සටහන් ක්‍රමයට අනුව ගනුදෙනු ලියන පොතයි.

(4) වත්කම්වල අඩුවීම වැඩිවීම සටහන් කරන පොතයි.

26 ගැනුම් ජ'නලයක තොරතුරු සටහන් කිරීමට භාවිතා කරන මූලාශ්‍ර ලේඛනය වනුයේ,

(1) ලදුපත (2) වවුචරය (3) ගැනුම් ඉන්වොයිසිය (4) හරපත

27 ව්‍යාපාරයක් බැංකු ණයක් ලබාගැනීමෙන් සිදුවන බලපෑම වනුයේ,

(1) වත්කම් වැඩිවේ, හිමිකම් වැඩිවේ. (2) වත්කම් අඩුවේ, හිමිකම් වැඩිවේ.

(3) හිමිකම් වැඩිවේ, වගකීම් වැඩිවේ. (4) වත්කම් වැඩිවේ, වගකීම් වැඩිවේ.

28 ව්‍යාපාරයට විකුණුම් ආදායම් ලැබීමෙන් ඇතිවන බලපෑම වන්නේ,

(1) වත්කම් වැඩිවේ, වගකීම් අඩුවේ. (2) වත්කම් වැඩිවේ, හිමිකම් වැඩිවේ.

(3) වත්කම් වැඩිවේ, වගකීම් වැඩිවේ. (4) හිමිකම් වැඩිවේ, වගකීම් වැඩිවේ.

29 ව්‍යාපාරයේ අයිතිකරු ව්‍යාපාරයේ මුදල් තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීමෙන් ඇතිවන ප්‍රතිඵලය වනුයේ,

(1) වත්කම් අඩුවේ, හිමිකම් අඩුවේ. (2) වත්කම් වැඩිවේ, හිමිකම් වැඩිවේ.

(3) වත්කම් වැඩිවේ, වගකීම් වැඩිවේ. (4) වත්කම් අඩුවේ, වගකීම් අඩුවේ.

30 ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ වෙනස්වීම් පහත පරිදි දක්වා ඇත.

වත්කම් වැඩිවීම රු. 50000 හිමිකම් වැඩිවීම රු. 50000 නම් එම ප්‍රතිඵලය ඇතිවීමට බලපෑ හැකි ගනුදෙනුව වනුයේ,

(1) රු. 50000 වූ බැංකු ණයක් ගත්තා

(2) වත්කම් මිලට ගත්තා රු. 50000/-

(3) අමතර ප්‍රාග්ධනය යෙදුවා රු. 50000/-

(4) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 50000/- ගත්තා

31 ව්‍යාපාරය රු. 40000 ක භාණ්ඩ ණයට විකුණා ඇත. එම ගනුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1) මුදල් හර රු. 40000/- විකුණුම් ගිණුම බැර රු. 40000/-

(2) විකුණුම් ගිණුම හර රු. 40000/- මුදල් ගිණුම බැර රු. 40000/-

(3) ණයගැති ගිණුම හර රු. 40000/- විකුණුම් ගිණුම බැර රු. 4000/-

(4) විකුණුම් ගිණුම හර රු. 40000/- ණයගැති ගිණුම බැර රු. 40000/-

32 ගනුදෙනු සටහන් කිරීමේ දී ජ'නල් වවුචරය මූලාශ්‍ර ලේඛනය ලෙස භාවිතා වන මූලික සටහන් පොත වනුයේ,

(1) මුදල් පොත (2) පොදු ජ්'නලය (3) සුළු මුදල් පොත (4) ගැනුම් ජ්'නලය

33 මූලික සටහන් පොතක් මෙන්ම ලෙජර් ගිණුමක් වශයෙන් යන ද්විත්ව කාර්යයක් ඉටුකරනු ලබන මූලික සටහන් පොත වනුයේ,

(1) පොදු ජ්'නලයයි. (2) ගැනුම් ජ්'නලයයි.

(3) විකුණුම් ජ්'නලයයි. (4) මුදල් පොතයි.

34 බොහෝ ව්‍යාපාර විසින් භාණ්ඩ විකුණන විට භාණ්ඩයක ලකුණු කළ මිලෙන් කිසියම් වටිනාකමක් අඩුකර විකුණන අවස්ථා ඇතිවේ. මෙසේ ලකුණු කළ මිලෙන් කරන අඩු කිරීම හඳුන්වනුයේ,

(1) මුදල් වට්ටම් ලෙසය (2) වෙළඳ වට්ටම් ලෙසය

(3) දුන් වට්ටම් ලෙසය (4) ලද වට්ටම් ලෙසය

35 ලද වට්ටම්වලට අදාළ නිවැරදි ද්විත්ව සටහන ඇතුළත් වන්නේ,

(1) ණය හිමි ගිණුම හර, ලද වට්ටම් ගිණුම බැර

(2) ලද වට්ටම් ගිණුම හර, ණය හිමි ගිණුම බැර

(3) ණය ගැති ගිණුම හර, ලද වට්ටම් ගිණුම බැර

(4) ලද වට්ටම් ගිණුම හර, ණය ගැති ගිණුම බැර

36 වෙළඳ ගනුදෙනු ණයට සිදුකරන විට ඉක්මනින් ණය බේරුම් කිරීමට ගැනුම්කරු පෙළඹවීම සඳහා යම් නිශ්චිත කාලයක් තුළ ණය බේරුම් කළහොත් ණය මුදලින් කරනු ලබන අඩු කිරීම හැඳින්වෙන්නේ,

(1) වට්ටම් ලෙසය. (2) වෙළඳ වට්ටම් ලෙසය.

(3) මුදල් වට්ටම් ලෙසය. (4) දුන් වට්ටම් ලෙසය.

37 දිනුකගේ ව්‍යාපාරයේ මාසයක් සඳහා නියම කරගෙන ඇති සුළු මුදල් අග්‍රිමය වනුයේ රු. 3000 කි. ජනවාරි මාසය තුළ අග්‍රිමයෙන් සුළු මුදල් ගෙවීම් රු. 1615/- සිදුවී ඇත. පෙබරවාරි ආරම්භයේ සුළු මුදල ප්‍රතිපූරණය කළ යුත්තේ කොපමණකින් ද?

(1) රු. 3000 කින් (2) රු. 1615 කින් (3) රු. 4615 කින් (4) රු. 1385 කින්

38 සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කෙරෙනවිට සටහන් කරන නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1) මුදල් පොත හර, සුළු මුදල් පොත බැර

(2) සුළු මුදල් පොත හර, මුදල් පොත බැර

(3) අදාළ වියදම් ගිණුම හර, සුළු මුදල් පොත බැර

(4) සුළු මුදල් පොත හර, අදාළ වියදම් ගිණුම බැර

39 සුළු මුදල් පොතක ලෙජර් ගිණුම් තීරුවේ සටහන් කළ තොරතුරුවලට අදාළ ද්විත්ව සටහන වනුයේ,

(1) අදාළ ගිණුම්වලට අගය වෙන වෙනම හර සුළු මුදල් පොත බැර

(2) සුළු මුදල් පොත හර අදාළ ගිණුම්වලට අගය වෙන වෙනම බැර

(3) ලෙජර් ගිණුම් නම් ගිණුමට හර සුළු මුදල් පොත බැර

(4) සුළු මුදල් පොත හර ලෙජර් ගිණුම් නම් ගිනුමට බැර

40 ගිනුම්කරණයේ මූලික අරමුණ වශයෙන් දක්විය හැක්කේ,

(1) ප්‍රමාණවත් ලාභයක් උපයා ඇතිද යන්න දැනගැනීම

(2) ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයට ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය සතුටුදායක දැයි දැන ගැනීම

(3) ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශවවලට තීරණ ගැනීමට ප්‍රමාණවත් වන

සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## මධ්‍ය වාර පරීක්ෂණය 2015

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

**10 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු වන කොටස අනිවාර්යය වේ. **A** කොටසින් ප්‍රශ්න 2 ක් ද, **B** කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

01 සාගරිකා සහ පියල් නිමි ඇඳුම් ව්‍යාපාරයක අයිතිකරුවෝ වෙති. අංජු ඔවුනගේ එකම දියණියයි. විදේශ සේවයක නිරතව සිට පැමිණි කසුන් හා අංජු විවාහ වී ඇත. යහමින් මුදල් ඇති කසුන් හා එක්ව නිමි ඇඳුම් මසා අළෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අංජු අදහස් කරගෙන සිටියි. එමනිසා කසුන් අංජු එක්වී ව්‍යාපාරය ඇරඹීමට රුපියල් ලක්ෂ පහක් හා ඔහු සතු ලක්ෂ තුනක් වටිනා ගොඩනැගිල්ලක් යොදවා ඇති අතර මැෂින් ආදී උපකරණ ගැනීමට බැංකුවෙන් ලක්ෂ දෙකක මුදලක් අනුමත වී ඇත.

(1) මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධානයකට අයත්වේදැයි නම් කරන්න.
(2) මෙම ව්‍යාපාර සංවිධානය සම්බන්ධයෙන් පවතින වාසිදායක ලක්ෂණ දෙකක් ලියන්න.
(3) ඉහත කියවෙන පරිදි මෙම ව්‍යාපාරය සතුවන ශක්ති දෙකක් ලියන්න.
(4) මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් පැවතිය හැකි දුර්වලතා දෙකක් ලියන්න.
(5) මෙම ව්‍යාපාරයෙන් ඉටුවන්නේ කුමන මිනිස් අවශ්‍යතාවක් ද? අවශ්‍යතාවල ලක්ෂණ 2 ක් ලියන්න.
(6) ඉහත ගනුදෙනු සිදුවීමෙන් පසුව වත්කම් = ප්‍රාග්ධනය + වගකීම් යන සමීකරණයට එම ගනුදෙනුවල බලපෑම කෙසේදැයි පෙන්වා දෙන්න.
(7) මෙම ව්‍යාපාරය සතු ජංගම නොවන වත්කම් මොනවාදැයි නම් කරන්න.
(8) මෙම ව්‍යාපාරයේ බාහිර මූළ වගකීම් යනු මොනවා ද? බාහිර වගකීම් පවතීනම් ඒවායෙහි වටිනාකම කොපමණ ද?
(9) අයිතිකරුගේ හිමිකම අඩුවීමට බලපෑ හැකි හේතු දෙකක් ලියන්න.
(10) මෙම ව්‍යාපාරයෙහි ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය විය හැකි මූලික පොත් 2 ක් නම් කරන්න. (2 x 10 = 20)

### A කොටස

02 (1) මිනිසාගේ අවශ්‍යතා හතරක් නම්කර එම අවශ්‍යතා සපුරාගන්නා විවිධ ආකාර දෙක බැගින් ලියන්න.
(2) නිෂ්පාදනයට අවශ්‍ය වන සම්පත් (නිෂ්පාදන සාධක) නම් කරන්න.
(3) ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවයන් ව්‍යාපාරයෙන් විවිධ අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරයි. ඒ අනුව පහත සඳහන් පාර්ශව දෙක අපේක්ෂා කරන අරමුණු දෙක බැගින් ලියන්න.
(a) සේවකයෝ (b) කළමනාකරුවෝ
(4) ව්‍යාපාර ඇල්මැති පාර්ශව වෙතින් ව්‍යාපාරය සඳහා විවිධ දායකත්වයන් අපේක්ෂා කරයි. පහත සඳහන් පාර්ශවයන්ගෙන් එසේ අපේක්ෂා කරන දායකත්ව දෙක බැගින් ලියන්න.
(a) සේවකයෝ (b) කළමනාකරුවෝ
(5) ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන බාහිර පරිසර සාධක හතරක් නම් කරන්න.

(2 x 5 = 10)

03 (1) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.
(2) ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.
(3) හිමිකාරත්වය යටතේ ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී පෞද්ගලික අංශයට අයත් වන ව්‍යාපාර සංවිධාන හතරක් නම් කරන්න.
(4) ලාභ අරමුණුකර නොගත් ව්‍යාපාරවල අරමුණු වන්නේ කුමක් ද?

(5) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී සැලකිල්ලට ගන්නා ප්‍රමාණාත්මක නිර්ණායක දෙකක් සඳහන් කරන්න. (2 x 5 = 10)

04 (1) පහත සඳහන් ව්‍යාපාර සංවිධාන සම්බන්ධයෙන් පවතින වාසි දෙකක් හා අවාසි දෙකක් සඳහන් කරන්න.

(A) ඒක පුද්ගල ව්‍යාපාර (B) හවුල් ව්‍යාපාර

(c) සංස්ථාපිත සමාගම් (d) රාජ්‍ය සංස්ථා (2 x 4 = 08)

(2) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (2 x 1 = 02)

## B කොටස

05 (අ) පහත සඳහන් ගනුදෙනු වත්කම් = ප්‍රාග්ධනය + වගකීම් යන සමීකරණයට බලපාන අන්දම පෙන්වන්න.

(1) රු. 125000/- මුදලක් ව්‍යාපාරයට යෙදවීම

(2) බැංකු ණයක් ගත්තා රු. 50000/-

(3) ලී බඩු, විමල ලී බඩු සමාගමෙන් ගත්තා රු. 30000/-

(4) ණය හිමියන්ට මුදල් ගෙව්වා රු. 10000/-

^5& fijl jegm f.õjd re' 2000$- 02)

(1 x 5 = 05)

(අ) (1) මූලාශ්‍ර ලේඛන යනු මොනවාදැයි හඳුන්වන්න.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය | මූලික පොත |
|---|---|---|
| අත්පිට විකුණුම් රු. 3000 | | |
| රු. 8000 වූ යන්ත්‍රයක් ණයට ගැනීම | | |
| රු. 2000 වූ බඩු තොගයක් සුනිල්ට ආපසු යැවීම | | |
| ගයාන්ගෙන් බඩු ගත්තා රු. 4000 | | |
| රක්ෂණ ගාස්තු ගෙව්වා රු. 1200 | | |

(1 x 5 = 05)

(ආ) by ; සඳහන් ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන සහ මූලික පොත් දක්වන්න.

(2) මූලාශ්‍ර ලේඛන වලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ආ) පහත සඳහන් වන්නේ නිපුනිකාගේ ව්‍යාපාරයේ සිදුවූ මුදල් ගනුදෙනුය.

2015. 01. 01 මුදල් ශේෂය රු. 28200/-
2015. 01. 02 මුදලට විකුණුම් රු. 5000/-
2015. 01. 04 වෙළඳ භාණ්ඩ මිලට ගත්තා රු. 11000/-
2015. 01. 06 සේවක වැටුප් ගෙව්වා රු. 3000/-
2015. 01. 07 බැංකු ණයක් ගත්තා රු. 25000/-
2015. 01. 10 ලිපි ද්‍රව්‍ය ගත්තා රු. 2000/-
2015. 01. 11 මුදලට විකුණුම් රු. 3000/-
2015. 01. 12 බැංකු ණය ගෙවීම රු. 3000/-
2015. 01. 14 අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට මුදල් ගත්තා රු. 500/-
2015. 01. 15 ණය ගැතියන්ගෙන් මුදල් ලැබුනා රු. 3000/-

නිපුනිකාගේ ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කරන්න. ( ල . 06)

07 (1) සුළු මුදල් අග්‍රිමය යනු කුමක් ද? ( ල . 02)

(2) සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම යනු කුමක් ද? (ල. 02)

(3) දුලක්ෂිගේ ව්‍යාපාරයේ 2015 පෙබරවාරි මාසයේ සුළු මුදල් පිළිබඳ තොරතුරු පහත දක්වේ.

2015. 02. 01 ප්‍රධාන මුදල් භාරකරුගෙන් ලැබුනා රු. 1000/-